මගේ අංකය:- පුවි/1/17/46 (ii)
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ,
කොළඹ 07 .

2021.02. 03

ප්‍රධාන කාර්යාලයේ සියලු අංශ ප්‍රධානීන් සහ
සියලු ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ කාර්මික නිලධාරි (සංරක්ෂණ සහකාර) තනතුරට සේවා පළපුරුද්ද හා කුසලතාව මත උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය ප්‍රසිද්ධ කිරීම</u>**

උක්ත කරුණට අදාළ කැඳවීමේ නිවේදනය, අයදුම්පත්‍රය හා ලකුණු පරිපාටිය මේ සමගින් අමුණා ඇති අතර එය ඔබ අංශයේ / ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ දැන්වීම් පුවරුවෙහි පළකර අදාළ සියලුම නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස මෙයින් කාරුණිකව දන්වමි.

පී.ඒ.එස්.එච්.බොරලැස්ස
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පී.ඒ.එස්.එච්. බොරලැස්ස
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ පන්තිය)
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ - 07.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) තනතුරට සේවා පළපුරුද්ද හා කුසලතාව මත උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) තනතුරෙහි පුරප්පාඩු 06ක් සම්පූර්ණ කිරීම සඳහා දැනට සේවයේ නියුතු හෝ පුරප්පාඩු පවතින වර්ෂයන්හි දෙසැම්බර් 31 දිනට සුදුසුකම් සම්පූර්ණ කරන ලද, එදිනට සේවයේ නියුතුව සිටි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) I වන ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් තමාගේ අධීක්ෂණ නිලධාරී මගින් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, තැ.පෙ.අංක 532, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07 යන ලිපිනයට 2021.02.25 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතු ය.

සටහන :

01. මෙම පුරප්පාඩු ගණනට අමතරව සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේදී උක්ත පුරප්පාඩු සඳහා විශ්‍රාමික නිලධාරීන් නිර්දේශ වීම මත එම නිලධාරීන්ගේ විශ්‍රාම දිනයන් අනුව තවත් පුරප්පාඩු ඇතිවිය හැක. එම පුරප්පාඩු ද පිරවීම සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී කටයුතු කරනු ලැබේ.

02. යම් වර්ෂයක් පවතින පුරප්පාඩුවක් සම්පූර්ණ කිරීමට සුදුසුකම් ලද අයදුම්කරුවන් නොමැති විටෙක එම පුරප්පාඩුව ඉදිරි වර්ෂයෙහි පවතින සම්පූර්ණ පුරප්පාඩු සංඛ්‍යාවට එකතු කර ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 10.3.1හි සඳහන් අනුපාත පරිදි පිරවීමට කටයුතු කරනු ලැබේ.

| සේවා පළපුරුද්ද හා කුසලතාව මත ඇති වී තිබෙන පුරප්පාඩු | |
|---|---|
| **වර්ෂය** | **සේවා පළපුරුද්ද හා කුසලතාව මත සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු ගණන** |
| 2015.12.31 | 01 |
| 2016.12.31 | 02 |
| 2017.12.31 | 01 |
| 2018.12.31 | 01 |
| 2019.12.31 | 01 |

01. සපුරාලිය යුතු සුදුසුකම් :

1.1 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ MN-03 වැටුප් ක්‍රමයෙහි, අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ - බණ්ඩ 2 ගණයෙහි, කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) I ශ්‍රේණියේ අවුරුදු 06ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හා නියමිත වැටුප් වර්ධක 06 උපයාගෙන තිබීම.

1.2 උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

1.3 අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙර වූ වසර හයක් (06) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

1.4 අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ - බණ්ඩ 2 සේවා ගණයෙහි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ලෙස එවකට රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරන ලද ආයතනයක් විසින් පවත්වනු ලබන කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පාඨමාලාව හදාරා තිබීම.

සටහන : ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති, පුරප්පාඩු ඇති වූ දිනයන්ට සේවයේ යෙදී සිට දැනට විශ්‍රාම ලබා ඇති නිලධාරීන්ට ද අයදුම් කළ හැකි ය.

02. වැටුප් පරිමාණය :

2015.05.24 දින සිට 2015.12.31 දින දක්වා ඇති වූ පුරප්පාඩු සඳහා රා.ප.ච.06/2006 අනුව MN7-2006 වැටුප් කේතය අදාළ වන අතර 2016.06.01 දින සිට 2019.12.31 දින දක්වා ඇති වූ පුරප්පාඩු සඳහා රා.ප.ච.03/2016 අනුව MN7-2016 වැටුප් කේතය අදාළ වේ. උසස්වීම දිනට වැටුප් ගෙවනු ලබන්නේ ඉහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල විධිවිධානයන්ට අනුකූලව ය.

03. බඳවා ගන්නා ආකාරය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන මේ සමගින් අමුණා ඇති ලකුණු පරිපාටිය ප්‍රකාරව, අයදුම්කරුවන්ගේ සේවා පළපුරුද්ද හා කුසලතාව සඳහා ලකුණු ලබාදෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත, අදාළ සෙසු අවශ්‍යතාවන් ද සම්පූර්ණ කර ඇති බවට පත්කිරීම් බලධරයා විසින් සූදුසුකම් පරීක්ෂා කර තහවුරු කරගැනීමෙන් අනතුරුව, එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි.

04. සේවා කොන්දේසි :

මුල් පත්වීම් ලිපියෙහි සඳහන් සියලුම කොන්දේසි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1930/12 දරන 2015.09.01 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන ද අදාළ වේ.

දිනය: 2021..02..03....

..............................................................

ලේකම්

ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී

ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

(නිල මුද්‍රාව)

එස්.ටී. කොඩිකාර
ලේකම්
ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා
ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
4 වන මහල, "සෙත්සිරිපාය" - II අදියර,
බත්තරමුල්ල.

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සේවා පළපුරුද්ද හා කුසලතාව මත විශේෂ පන්තියේ පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත්‍රය**

I වන කොටස - නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතු ය.

1.0 අයදුම් කරන තනතුරු ඇති වූ වර්ෂය : 2015/2016/2017/2018/2019 (*අනවශ්‍ය වර්ෂ කපා හරින්න)

2.0 නිලධාරියාගේ සම්පූර්ණ නම : ..............................

(සිංහලෙන්) ..............................

3.0 නිලධාරියාගේ සම්පූර්ණ නම : ..............................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..............................

4.0 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

5.0 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

6.0 වර්තමාන සේවා ස්ථානය : ..............................

7.0 ලිපිනය : ..............................

..............................

දුරකථන අංකය : ස්ථාවර - ☐☐☐☐☐☐☐☐☐☐
ජංගම - ☐☐☐☐☐☐☐☐☐☐

8.0 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

9.0 (අ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියට පත් වූ දිනය : ..............................

(ආ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ වසර 06ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන දිනය : ..............................

(ඇ) මෙම අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියට පත් වූ දින සිට උසස් කිරීමේ දිනට සේවා කාලය :
වර්ෂ ☐☐ මාස ☐☐ දින ☐☐

(ඈ) සේවයෙන් විශ්‍රාම ගත් දිනය : ..............................
(විශ්‍රාමික නිලධාරීන්ට පමණක් අදාළ වේ)

10.0 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියට පත් වූ දින සිට වැටුප් රහිත නිවාඩු හෝ අඩ වැටුප් නිවාඩු ලබා තිබේද? (තිබේ නම් පහත විස්තර සඳහන් කරන්න)

| කාලය | | අඩ වැටුප්/වැටුප් රහිත නිවාඩු සංඛ්‍යාව | කාරණය |
|---|---|---|---|
| සිට | දක්වා | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

**11.0** පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබේද?

ඔව් ☐ නැත ☐

**12.0** (අ) අධීක්ෂණ කළමනාකරණ සහකාර (MN-03) සේවා ගණයේ I ශ්‍රේණියට අදාළ තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබේද?

ඔව් / නැත / අදාළ නොවේ

(ආ) "ඔව්" නම් සමත් වූ දිනය : ..............................................................

**13.0** වෘත්තීය / අතිරේක අධ්‍යාපන සුදුසුකම් සහ රැකියා ක්ෂේත්‍රයට අදාළ පුහුණු පාඨමාලා හෝ වැඩමුළු පිළිබඳ විස්තරය

**13.1** අතිරේක අධ්‍යාපන සුදුසුකම් (වාස්තු විද්‍යා / ඉංජිනේරු ක්ෂේත්‍රයට සම්බන්ධ) :

| අනු අංකය | අධ්‍යාපන සුදුසුකම් | සුදුසුකම් සම්පූර්ණ කළ වර්ෂය | ආයතනය |
|---|---|---|---|
| 01. | ඩිප්ලෝමා | | |
| 02. | සහතික පත්‍ර | | |

**13.2** පරිගණක සාක්ෂරතාව :

| අනු අංකය | අධ්‍යාපන සුදුසුකම් | සුදුසුකම් සම්පූර්ණ කළ වර්ෂය | ආයතනය |
|---|---|---|---|
| 01. | පුරාවිද්‍යා සංරක්ෂණ/වාස්තු විද්‍යා/ ඉංජිනේරු ක්ෂේත්‍රයට සම්බන්ධ පරිගණක යෙදවුම් පිළිබඳ පුහුණුව - ඩිප්ලෝමා හෝ ඊට ඉහළ | | |
| 02. | පුරාවිද්‍යා සංරක්ෂණ/වාස්තු විද්‍යා/ ඉංජිනේරු ක්ෂේත්‍රයට සම්බන්ධ පරිගණක යෙදවුම් පිළිබඳ පුහුණුව - සහතික පත්‍ර | | |
| 03. | සාමාන්‍ය පරිගණක පුහුණුව - ඩිප්ලෝමා | | |
| 04. | සාමාන්‍ය පරිගණක පුහුණුව - සහතික පත්‍ර | | |

**13.3** රැකියා ක්ෂේත්‍රයට අදාළ පුහුණු පාඨමාලා හෝ වැඩමුළු :

(අ) දෙදින හෝ ඊට වැඩි වැඩමුළු/පාඨමාලා : ..............................................................

..............................................................................................................................

(ආ) එක්දින හෝ ඊට වැඩි වැඩමුළු/පාඨමාලා : ..............................................................

..............................................................................................................................

**14.0** ඉහත සඳහන් තොරතුරු නිරවද්‍ය හා විශ්වාසී ලෙස මා සපයා ඇති බැව් ප්‍රකාශ කොට සහතික කරමි.

................................................ ..................................................

දිනය අයදුම්කරුගේ අත්සන

**II වන කොටස - දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහ සහතිකය**

I. මෙම අයදුම්කරු සම්බන්ධයෙන් පූර්වාසන්න වසර 05 තුළ විනය ක්‍රියාමාර්ග ගෙන හෝ ගැනීමට අදහස් කර ඇත / නැත. (ඇත්නම් ඒ පිළිබඳව විස්තර පහත සඳහන් කරන්න)

..............................................................................................................................

..............................................................................................................................

II. මෙම අයදුම්කරු I ශ්‍රේණියට උසස් වීමෙන් පසු වැටුප් රහිත හෝ අඩ වැටුප් නිවාඩු ලබාගෙන තිබේද? ඔව් / නැත ("ඔව්" නම් පහත විස්තර සඳහන් කරන්න)

| අනු අංකය | නිවාඩු ලබාගැනීමට අදාළ කොන්දේසි | කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| 01. | ආයතන සංග්‍රහයේ V:2.5.4 අනුව | | |
| 02. | ආයතන සංග්‍රහයේ XII:16 අනුව | | |
| 03. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 10 අනුව | | |
| 04. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 අනුව | | |
| 05. | ආයතන සංග්‍රහයේ XII:36 අනුව | | |
| 06. | අනෙකුත් වැටුප් රහිත නිවාඩු | | |

III. සේවා කාලයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති/නැති බව ද, නියමිත වැටුප් වර්ධක හය (06)ම උපයාගෙන ඇති/නැති බව ද, උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති/නැති බව ද,

IV. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයන් පෙන්නුම් කර ඇති/නැති බව ද,

V. අධීක්ෂණ කළමනාකරණ සහකාර (MN-03) සේවා ගණයේ I ශ්‍රේණියට අදාළ තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී ඇති/නැති බව ද,

VI. ඒ අනුව ඔහු/ඇය මෙම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති/නැති බව සහතික කරන අතර මෙම අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි / නිර්දේශ නොකරමි.
(අදාළ නොවන කොටස් කපා හරින්න)

................................................ ..................................................

දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) තනතුරට උසස් කිරීම සඳහා වූ ලකුණු පරිපාටිය

| අ.අ. | අනුමත ලකුණු පරිපාටිය | උපරිම ලකුණු | මුළු ලකුණු |
|---|---|---|---|
| 01. | සේවා පළපුරුද්ද සඳහා :<br>• අධීක්ෂණ කළමනාකරණ සහකාර (MN-03) සේවා ගණයෙහි, කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) I ශ්‍රේණියේ අවුරුදු 06ක සතුටුදායක සේවා කාලයෙන් පසුව එළඹෙන අමතර සේවා කාලය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ. වැඩිම අමතර සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අයදුම්කරුට උපරිම ලකුණු ප්‍රමාණය හිමිවන අතර අනෙකුත් අයදුම්කරුවන්ට ඊට සමානුපාතිකව ඔවුන්ගේ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට ලකුණු ලබාදෙනු ලැබේ. | 50 | 50 |
| 02. | කුසලතාව සඳහා :<br>2.1 අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>2.1.1 වාස්තු විද්‍යා/ඉංජිනේරු ක්ෂේත්‍රයට සම්බන්ධ අතිරේක අධ්‍යාපන සුදුසුකම් - ලකුණු 15<br>• ඩිප්ලෝමා හෝ ඊට ඉහළ - ලකුණු 15<br>• සහතික පත්‍ර - ලකුණු 05<br>2.1.2 පරිගණක සාක්ෂරතාව - ලකුණු 10<br>• පුරාවිද්‍යා සංරක්ෂණ/වාස්තු විද්‍යා/ඉංජිනේරු ක්ෂේත්‍රයට සම්බන්ධ පරිගණක යෙදවුම් පිළිබඳ පුහුණුව - ඩිප්ලෝමා හෝ ඊට ඉහළ - ලකුණු 10<br>• පුරාවිද්‍යා සංරක්ෂණ/වාස්තු විද්‍යා/ඉංජිනේරු ක්ෂේත්‍රයට සම්බන්ධ පරිගණක යෙදවුම් පිළිබඳ පුහුණුව - සහතික පත්‍ර - ලකුණු 7.5<br>• සාමාන්‍ය පරිගණක පුහුණුව - ඩිප්ලෝමා - ලකුණු 05<br>• සාමාන්‍ය පරිගණක පුහුණුව - සහතික පත්‍ර - ලකුණු 2.5 | 25 | 50 |
| | 2.2 ක්ෂේත්‍රයට අදාළ පුහුණු පාඨමාලා හෝ වැඩමුළු සඳහා<br>• දෙදින හෝ ඊට වැඩි වැඩමුළු/පාඨමාලා - ලකුණු 03<br>• එක්දින වැඩමුළු/පාඨමාලා - ලකුණු 02 | 10 | |
| | 2.3 විශේෂ කුසලතා<br>• තම තනතුරට අදාළ ක්ෂේත්‍රයේ විශේෂ සුදුසුකම් සඳහා (පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අදාළ ප්‍රකාශන, තත්ත්ව පරීක්ෂණ වාර්තා, පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳ සැලසුම් ආදිය ඉදිරිපත් කිරීමේදී එක් වාර්තාවකට ලකුණු 03 බැගින් උපරිම වාර්තා 05ක් සඳහා) | 15 | |

සැ.යු :

i. අයදුම්කරු කිසියම් වසරක ඇති වූ පුරප්පාඩුවකට අයදුම් කරන්නේ නම් එම වසරේ දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර ඇති සුදුසුකම් සඳහා පමණක් ලකුණු පිරිනැමේ.

ii. බඳවා ගැනීමේදී හෝ කාර්යක්ෂමතා කඩඉම් සඳහා සලකා නොබැලූ සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.

iii. ඉහත 2.1 යටතේ අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබාදීමේදී උපරිම එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.

iv. ඉහත සියලුම ඩිප්ලෝමා සහ සහතික පත්‍ර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ ආයතනයකින් පිරිනමා ඇති හෝ බාහිර ආයතනයකින් පිරිනමා ඇත්නම් පිළිවෙළින් ඩිප්ලෝමා NVQ 5 හෝ ඊට ඉහළ සහ සහතික පත්‍ර NVQ 3 හෝ ඊට ඉහළ මට්ටමේ විය යුතු ය.